# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 ජනවාරි මාසයේ දී වාර්තා කළ 51.7 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 පෙබරවාරි මාසයේ දී 55.6 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. ඒ අනුව, 2018 ජනවාරි මාසයේ දී ඇතිවූ සෘතුමය පහළ යෑමෙන් අනතුරුව, පෙබරවාරි මාසයේ දී නිෂ්පාදන අංශයෙහි කටයුතු වැඩි වේගයකින් වර්ධනය විය. මේ සඳහා, නව ඇණවුම් උප දර්ශකයෙහි ඉහල යෑම ප්‍රධාන වශයෙන්ම බලපාන ලදී. එමෙන්ම, නව ඇණවුම් උප දර්ශකය ඉහළ යෑමත් සමඟම නිෂ්පාදන උප දර්ශකය ද ඉහළ යන ලදී. එසේ නමුත්, පෙබරවාරි මාසය තුළ රාජකාරී දින ගණන අඩු වීම හේතුවෙන්, මෙම ඉහළ යෑම නව ඇණවුම උප දර්ශකයෙහි ඉහළ යෑමට සාපේක්ෂව අඩු අගයක් වේ. තවද, ගැනුම් තොග උප දර්ශකය ද මෙම මාසය තුළ දී ඉහළ ගිය අතර, සේවා නියුක්ති උප දර්ශකය සුළු වශයෙන් ඉහළ යන ලදී. මේ අතරතුරදී, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් ඉහළ යන ලදී. තවද, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, 2018 පෙබරවාරි මාසයේ දී සමස්ථයක් ලෙස නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 ජනවාරි මාසයේදී වාර්තා වූ 56.6 දර්ශක අගයට සාපේක්ෂව පෙබරවාරි මාසයේදී 58.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. මෙම වර්ධනය සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය හා අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උපදර්ශක දායක විය. ව්‍යාපාර ක්‍රියාකාරකම් වල දක්නට ලැබුණු තියුණු වර්ධනයට මූල්‍ය, තොරතුරු තාක්ෂණ හා ප්‍රවාහන යන සේවා අංශ දායක විය. මේ අතර 2018 ජනවාරි මාසයේ දී සේවා නියුක්තියෙහි සිදු වූ අඩුවීමට සාපේක්ෂව පෙබරවාරි මාසයේ දී එහි වැඩිවීමක්, විශේෂයෙන්ම සිල්ලර හා තොග වෙළඳාම් යන අංශයෙහි දක්නට ලැබිණි. තවද, සේවා සපයන්නන්ගේ ඉදිරි මාස 3 සඳහා අපේක්ෂාවන් ද මධ්‍යස්ථ ලෙස ඉහළ ගිය බව සමීක්ෂණය තුළින් හෙළිදරව් විය. පසුගිය මාස දෙක තුළ දක්නට ලැබුණු වැඩිවන ප්‍රවණතාවයට ප්‍රතිවිරුද්ධව, නිම කිරීමට ඇති කාර්යයන් පෙබරවාරි මාසයේ දී අඩුවිය. මේ සඳහා නව බඳවාගැනීම් හේතුවෙන් සේවා නියුක්තියෙහි ඇති වූ වර්ධනය යම් දායකත්වයක් සපයන ලදී. ඉදිරි කාලයේ දී ඇතිවිය හැකි වැටුප් වර්ධන හේතුවෙන් අපේක්ෂිත ශ්‍රම පිරිවැය, 2018 පෙබරවාරි මාසයේ දී ඉහළ ගිය අතර, සේවා අංශයේ අය කරන මිල ගණන් අඩු වේගයකින් ඉහළ ගියේය.

| | වා\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | 2016 | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | 2017 | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | 2018 | 51.7 | 55.6 | - | - | - | - | - | - | - | - | - | - |
| සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | 2016 | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | 2017 | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | 2018 | 56.6 | 58.4 | - | - | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.